විෂ මත්ද්‍රව්‍ය මුලිනුපුටා දැමීම සඳහා වන ‘‘රටම එකට ජාතික මෙහෙයුම’’ !

Contents

01 හැඳින්වීම 2
02 ප්‍රවේශය 2
03 දැක්ම සහ මෙහෙවර 3
04 අරමුණු 3
ප්‍රධාන අරමුණ 3
නිශ්චිත අරමුණු 3
05 ව්‍යුහය සහ සංයුතිය 4
ජාතික මෙහෙයුම් සභාවේ කාර්‍යභාර 5
06 අරමුදල් ප්‍රභවය 5
07 අධීක්ෂණය සහ ඇගයීම 5

01. හැඳින්වීම

අපගේ මාතෘභූමිය අද මුහුණ දෙන අතිශය භයානක සහ තීරණාත්මක අභියෝගය වන්නේ විෂ මත්ද්‍රව්‍ය උවදුර සහ ඊට සමගාමීව ක්‍රියාත්මක වන මහා පරිමාණ ජාවාරමයි. සත්‍ය වශයෙන්ම, අපරාධ ලෝකයේ ප්‍රධානතම කේන්ද්‍රස්ථානය බවට මෙම මාරාන්තික වසංගතය පත්ව ඇති බවට පොලිස් විමර්ශන සාක්ෂි දරයි. විදේශීය සහ දේශීය පාතාල කල්ලිවල අඳුරු සබඳතා තුළින් පිටතින් ගෙන ආ මෙම ජාවාරම, අද වන විට දේශීය නිෂ්පාදන ජාලයක් දක්වා මුල් ඇදගෙන, රට තුළම පිළිකාවක් සේ ව්‍යාප්ත වී තිබේ.

මෙම විනාශකාරී ජාලය කෙතරම් ශක්තිමත්ද යත්, ඇතැම් දේශපාලන බලපෑම්, ඇතැම් රාජ්‍ය නිලධාරීන්ගේ සහ ආරක්ෂක අංශ සාමාජිකයින්ගේ පවා අතපෙවීම් තුළින් එය සංවිධානාත්මකව සහ නොසැලෙන යාන්ත්‍රණයක් ඔස්සේ ක්‍රියාත්මක වන බව නොරහසකි.

කෙසේ වෙතත්, වත්මන් රජය බලයට පත්වීමත් සමඟ ගත් දැඩි ක්‍රියාමාර්ග හමුවේ, ශ්‍රී ලංකා පොලිසිය සහ ආරක්ෂක අංශ ඉතිහාසයේ වැඩිම විෂ මත්ද්‍රව්‍ය තොගයක් අත්අඩංගුවට ගෙන, ප්‍රමුඛ පෙළේ ජාවාරම්කරුවන් රැසක් නීතියේ රැහැනට හසු කර ගැනීමට සමත් වී ඇත.

එහෙත්, මෙම විෂ මත්ද්‍රව්‍ය උවදුරෙහි ගැඹුර හා වේගවත් ව්‍යාප්තිය සලකා බලන විට, ආරක්ෂක අංශවල අඛණ්ඩ මෙහෙයුම් පමණක් ප්‍රමාණවත් නොවේ. මේ මහා විනාශය මුලිනුපුටා දැමීමට නම්, එය **ජාතික අවශ්‍යතාවක්** ලෙස සලකා, **මහජන සහභාගීත්වය සහිත පුළුල් වැඩපිළිවෙළක් හදිසි සහ කඩිනම්** ප්‍රවේශයකින් ක්‍රියාත්මක කළ යුතුව ඇත. තවදුරටත් ප්‍රමාද වීම යනු, මහජන ආරක්ෂාව බිඳ දමමින්, සංවිධානාත්මක අපරාධ රැල්ලක් වර්ධනය වීමට ඉඩ දීමකි.

එබැවින්, ජාතියේ හෙට දවස සුරක්ෂිත කිරීම සඳහා, හදිසි සහ කඩිනම් ජාතික වැඩපිළිවෙළක් තුළින්, නිශ්චිත ඉලක්ක ගත කාලසීමාවක දී සමස්ත සමාජයම බලගැන්වීම අපගේ වගකීම සහ යුතුකමයි.

02. ප්‍රවේශය

විෂ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය ජාතික උපද්‍රවයක් බවට පත්ව ඇති තත්ත්වයක් තුළ, එය මුලිනුපුටා දැමීමද ජාතික මට්ටමේ සංවිධානාත්මක වැඩසටහනක් ඔස්සේ සිදු කළ යුතුය. මෙම ජාතික කාර්යය පොලිසියේ හෝ ආරක්ෂක අංශයේ නිලධාරීන් වෙත පමණක් පැවැරිය නොහැකි අතර, ඒ සඳහා ජාතික මට්ටමේ දේශපාලන නායකත්වයක්, කාර්යක්ෂම තීන්දු තීරණ ගැනීමේ රාජ්‍ය අංශයේ යාන්ත්‍රණයක් මෙන්ම පුළුල් මහජන සහභාගීත්වයක් තහවුරු කරගත යුතුය. ඒ සඳහා සුදුසු යාන්ත්‍රණයක් කඩිනමින් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාව රට හමුවේ පවතී.

විෂ මත්දුව්‍ය ජාවාරම අඛණ්ඩව පැවැතීම කෙරෙහි බලපාන ප්‍රධාන පාර්ශ්වකරුවන් හෝ බලවේග දෙකක් හඳුනා ගත හැකි ය. එනම්;

(අ). විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්/බෙදා හරින්නන් සහ

(ආ). විෂ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් වශයෙනි.

යෝජිත වැඩසටහන මඟින් විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්, බෙදාහරින්නන් සහ ඒ සඳහා විවිධ අනුග්‍රහ දක්වන්නන් කෙරෙහි නීතිය ක්‍රියාත්මක කිරීමට අමතරව ඔවුන් හුදෙකලා කරමින්, ඔවුන්ට එරෙහිව දැවැන්ත සමාජ බලපෑමක් සහ පීඩනයක් ගොඩනැඟීම සඳහා රජය, ශ්‍රී ලංකා පොලිසිය සහ ආරක්ෂක අංශ, සිවිල් සංවිධාන සහ සමස්ත පුරවැසියන් ඒකාබද්ධ කරගත් ජාතික මෙහෙයුමක් දියත් කිරීමේ අවශ්‍යතාවක් උද්ගතව ඇත.

මෙම වැඩසටහන මඟින්, ඉහත සඳහන් පළමු පාර්ශ්වය සමස්ත සමාජයෙන් සහ රටෙන් ඉවත් කිරීමත්, දෙවන පාර්ශ්වය වන මත්ද්‍රව්‍ය භාවිත කරන පිරිස එම විනාශකාරී පුරුද්දෙන් ගලවා ගැනීමත්, අපේක්ෂා කෙරේ.

03. දැක්ම සහ මෙහෙවර

✓ දැක්ම

"මිනින් තොර රටක් - සතුටින් පිරි හෙටක්" නිර්මාණය කිරීම.

✓ මෙහෙවර

මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්, බෙදාහරින්නන්, ජාවාරම්කරුවන් සහ භාවිත කරන්නන් හුදකලා කර, ඔවුන්ට එරෙහිව දැවැන්ත සමාජ බලපෑමක් සහ පීඩනයක් ගොඩනැගීම සඳහා රජය, ආරක්ෂක අංශ, සිවිල් සංවිධාන සහ සමස්ත පුරවැසියන් ඒකාබද්ධ වූ ජාතික පෙරමුණක් නිර්මාණය කිරීම.

04. අරමුණු

ප්‍රධාන අරමුණ

විෂ මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දැමීම සඳහා ජාතික මට්ටමේ දේශපාලන නායකත්වයක්, කාර්යක්ෂම රාජ්‍ය යාන්ත්‍රණයක් සහ පුළුල් මහජන සහභාගීත්වයක් සහිත **සංවිධානාත්මක වැඩසටහනක්** ක්‍රියාත්මක කිරීම.

නිශ්චිත අරමුණු

I. ජාවාරම්කරුවන් සහ බෙදාහරින්නන් මර්දනය කිරීම සහ හුදෙකලා කිරීම

- විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්, බෙදාහරින්නන් සහ අනුග්‍රාහකයන් කෙරෙහි **නීතිය දැඩිව ක්‍රියාත්මක කිරීම**.
- සමස්ත සමාජය, පොලිසිය, ආරක්ෂක අංශ සහ සිවිල් සංවිධාන ඒකාබද්ධ කරමින්, මෙම පාර්ශ්ව **හුදෙකලා කරමින් ඔවුන්ට එරෙහිව දැවැන්ත සමාජ බලපෑමක් සහ පීඩනයක්** ගොඩනැඟීම.
- මෙම **ජාවාරම් ජාලය බිඳ දමා** ඔවුන් සමස්ත සමාජයෙන් සහ රටෙන් ඉවත් කිරීම.

II. මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් පුනරුත්ථාපනය කිරීම සහ සමාජානුයෝජනය

- මත්ද්‍රව්‍යවලට ගොදුරු වූවන්/ භාවිත කරන්නන් **පුනරුත්ථාපනය කිරීම** සහ නිසි ප්‍රතිකාර ඔස්සේ යහපත් **සෞඛ්‍ය තත්ත්වයට පත් කිරීම**.
- ඔවුන්ගේ **සමාජානුයෝජනය** සඳහා අවශ්‍ය සමාජ සහාය ලබා දීම සහ එම විනාශකාරී පුරුද්දෙන් ගලවා ගැනීම.

III. ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය ස්ථාපනය කිරීම


- වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා **ජාතික මෙහෙයුම් සභාවක්** කඩිනමින් පිහිටු වීම.
- ජාතික මෙහෙයුම් සභාවේ නායකත්වය යටතේ මෙහෙයුම නිවැරදි සහ **ඒකීය දිශානතියකට යොමු කිරීම**.

- **දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමෙන්** ව්‍යුහයක් පිහිටුවා පුළුල් **මහජන සහාය ලබා ගැනීමේ** යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම.

IV. සමාජ දැනුවත්භාවය සහ නීතිමය රාමුව ශක්තිමත් කිරීම:

- "ඉවත් වෙනු" තේමාව ඔස්සේ දැඩි ප්‍රචාරණ ක්‍රියාවලියක් මඟින් සමාජය විෂ මත්ද්‍රව්‍ය උවදුර සම්බන්ධයෙන් **කඩිනමින් දැනුවත් කිරීම.**
- **නව පනත් කෙටුම්පතක් ව්‍යවස්ථාදායකය වෙත ඉදිරිපත් කර සම්මත කර ගැනීම** මඟින් පවත්නා **නෛතික රාමුව ශක්තිමත් කිරීම.**
- පළමු අදියර තුළ ක්‍රියාදාමය මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීම.

05. ව්‍යුහය සහ සංයුතිය



මෙහි ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මෙහෙයුම් සභාවක් පිහිටුවනු ලැබේ. (ඇමුණුම 1) මෙම මෙහෙයුම් සභාවේ නායකත්වය සහ මඟපෙන්වීම යටතේ රජය සහ මහජනතාව ඒකාබද්ධ කරමින් විෂ මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දැමීමේ ජාතික මෙහෙයුම සැලසුම් කෙරේ. එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පුළුල් මහජන සහාය ලබා ගැනීමේ යාන්ත්‍රණයක් යෝජනා කරන අතර, ඒ සඳහා දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමෙන් මහජන ආරක්ෂක කමිටුවල සහායද සහිතව ව්‍යුහයක් පිහිටුවීමට අපේක්ෂා කෙරේ.

මෙහිදී දිස්ත්‍රික් මෙහෙයුම් සභාව, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිගේ මූලිකත්වයෙන් ජාතිය මෙහෙයුම් සභාවේ සංයුතියට අනුරූපිවද (ඇමුණුම 2), ප්‍රාදේශීය මෙහෙයුම් සභාව, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති මූලිකත්වයෙන් ජාතික මෙහෙයුම් සභාවේ සංයුතියට අනුරූපිවද (ඇමුණුම 3) පිහිටුවනු ලබයි. තවද, දැනමත් 14,000ක් වූ ග්‍රාම සේවා වසම් ආවරණය වන පරිදි මහජන ආරක්ෂක කමිටු පිහිටුවා ඇත. මෙයට අමතරව “රටම එකට ජාතික මෙහෙයුම” මහජනතාව අතරට ගෙන යාම සඳහා සන්නාම තානාපතිවරුන් සහ ප්‍රකාශකයින්ගෙන් සමන්විත ව්‍යුහයක්ද සකස් කෙරෙනු ඇත.

ජාතික මෙහෙයුම් සභාවේ කාර්යභාරය

I. නායකත්වය සහ මහපෙන්වීම

- ජාතික මට්ටමේ නායකත්වය සැපයීම: සමස්ත විෂ මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දැමීමේ ක්‍රියාවලියට අවශ්‍ය ජාතික මට්ටමේ දේශපාලන නායකත්වය සහ කාර්යක්ෂම තීන්දු තීරණ ගැනීමේ යාන්ත්‍රණය සඳහා මහපෙන්වීම
- ඒකීය දිශානතිය තහවුරු කිරීම: වැඩසටහන නිවැරදි සහ ඒකීය දිශානතියකට යොමු කිරීම.

II. ජාතික මෙහෙයුම සැලසුම් කිරීම වැඩසටහන සැලසුම් කිරීම

- රජය සහ මහජනතාව ඒකාබද්ධ කරගත් විෂ මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දැමීමේ ජාතික මෙහෙයුම සැලසුම් කිරීම.

III. ක්‍රියාත්මක කිරීමේ ව්‍යුහය ස්ථාපිත කිරීම

- මහජන සහාය යාන්ත්‍රණය නිර්මාණය: පුළුල් මහජන සහාය ලබා ගැනීමේ යාන්ත්‍රණය ස්ථාපිත කිරීම.
- ප්‍රාදේශීය ව්‍යුහය පිහිටුවීම: දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමෙන් මහජන ආරක්ෂක කමිටුවල සහාය සහිතව වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ව්‍යුහයක් පිහිටුවීම.

IV. නීතිමය සහ මූල්‍යමය ශක්තිමත් කිරීම

- නෛතික රාමුව ශක්තිමත් කිරීම: ක්‍රියාදාමය සඳහා අවශ්‍ය නව පනත් කෙටුම්පතක් ව්‍යවස්ථාදායකය වෙත ඉදිරිපත් කර සම්මත කර ගැනීමට කටයුතු කිරීම.
- මූල්‍යමය ශක්තිමත් කිරීම: සමස්ත විෂ මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දැමීම සඳහා වන ක්‍රියාදාමය මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීම.

06. අරමුදල් ප්‍රභවය

මෙම වැඩසටහන සඳහා 2025 වසරේ අවශ්‍ය ප්‍රතිපාදන Clean Sri Lanka වැඩසටහන මඟින් සලසා ගැනීමටත්, 2026 වසර සඳහා අවශ්‍ය ප්‍රතිපාදන යෝජිත අමාත්‍යාංශ සඳහා වෙන් කිරීමත් සුදුසුය.

07. අධීක්ෂණය සහ ඇගයීම

I. වසරක් අවසානයේ ප්‍රගති සමාලෝචනයක් සිදු කිරීම සහ ඇගයීම

II. ප්‍රචාරණ ආකෘතිය වෙනස් කරමින් වැඩසටහන දෙවෙනි මානයකට රැගෙන යාම.

III. ප්‍රතිඵල වාර්තාකරණය. වසරක් තුළ අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය ප්‍රමාණය, සැකකරුවන් ගණන, පුනරුත්ථාපනය වූ සංඛ්‍යාව සහ අපරාධ අඩු වීම පිළිබඳ සංඛ්‍යා ලේඛන ජනතාවට ඉදිරිපත් කිරීම.

IV. ජනතා ඇගයීම. මෙහෙයුමට දායක වූ ග්‍රාම ආරක්ෂක කමිටු, සිවිල් සංවිධාන සහ නිර්භීත පුරවැසියන් ජාතික මට්ටමින් ඇගයීමට ලක් කිරීම.

ඇමුණුම 1

රටම එකට ජාතික මෙහෙයුම් සභාවේ සංයුතිය

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති - සභාපති
2. ආගමික නායකයින් විසින් නම් කරනු ලැබූ නියෝජිතයින්
3. මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය
4. ජනාධිපති ලේකම් - ලේකම්
5. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්
6. මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලේකම්
7. සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්
8. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්
9. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්
10. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම්
11. බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්
12. පොලිස්පති
13. ත්‍රිවිධ හමුදාපතිවරු
14. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
15. අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
16. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව
17. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
18. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්
19. රජයේ ප්‍රධාන රස පරීක්ෂක
20. රාජ්‍ය මාධ්‍ය ආයතන ප්‍රධානීන්
21. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති
22. සිවිල් සංවිධාන නියෝජනය කරමින් නියෝජිතවරු
23. විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් නියෝජිතවරු

ඇමුණුම 2

රටම එකට දිස්ත්‍රික් මෙහෙයුම් සභාවේ සංයුතිය

1. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති - සභාපති
2. දිස්ත්‍රික් ලේකම්
3. පළාත් ආණ්ඩුකාරවරයා
4. ප්‍රධාන ලේකම්
5. පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
6. දිස්ත්‍රික් භාර පොලිස්පතිවරු
7. ආගමික නායකයින්
8. සිවිල් සංවිධාන නියෝජිතයින්
9. ආරක්ෂක අංශ නියෝජිතයින්
10. පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු
11. පළාත් පාලන කොමසාරිස්
12. පළාත් පරිවාස කොමසාරිස්
13. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
14. අන්තරදායක ඖෂධ නියාමන අධිකාරියේ දිස්ත්‍රික් නිලධාරීන්

ඇමුණුම 3

රටම එකට ප්‍රාදේශීය කමිටුවේ සංයුතිය

1. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති - සභාපති
2. ප්‍රාදේශීය ලේකම්
3. පොලිස් ස්ථානාධිපතිවරු
4. පලාත් පාලන ආයතන ප්‍රධානීන්
5. සෞඛ්‍ය සේවා නිලධාරීන්
6. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
7. පරිවාස නිලධාරීන්
8. ළමා හිමිකම් ආරක්ෂක නිලධාරීන්
9. ප්‍රාදේශීය ළමා ආරක්ෂණ අධිකාරිය
10. අන්තරාදායක ඖෂධ පාලන අධිකාරියේ ප්‍රාදේශීය නිලධාරීන්
11. රෝහල් අධ්‍යක්ෂ / වෛද්‍ය අධිකාරි
12. ස්ථාන භාර නිලධාරී, යොවුන් සේනාංකය
13. ස්ථාන භාර නිලධාරී වෘත්තීය පුහුණු අධිකාරිය / විදුහල්පති කාර්මික විද්‍යාලය
14. තරුණ සේවා නිලධාරි
15. සුරාබදු අධිකාරි
16. ප්‍රජා විශෝධන නිලධාරී